# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,232 — 1936ක්වූ ජූලි මස 3 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,314 (කෑගල්ල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1936ක්වූ ජූලි මස 3වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1936ක්වූ ජූනි මස 26වෙනි දින කොළඹ ඉඩම් නිරවුල්කිරීමේ කන්තෝරුවේදීය.

සී. ඇෆ්. ඉන්ගල්ඩව්,
නිරවුල්කිරීමේ සහකාර නිලධාරිතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම් කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

(*c*) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි අතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරණු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

#### උප ලේඛනය.

සබරගමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කේ කෝරලතුනේ නැගෙනහිර අටුළුගම්කෝරළේ ශ්‍රීපාද අඩවියේ පිහිටි මෙහි පහත විස්තර සඳහන්වන බිම්කට්ටි, එනම්:—

I. වෙනි කොටස.

ටෝපෝ මූල් සිතියම නො. 1.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | හෙරලිවත්තෙමූකලාන, කිරීවෙලහින් නෙමූකලාන, කරුවෙල්කැලේමූකලාන, මූවාහිටිගලඋඩමූකලාන, දූන්ගාලේමූකලාන, කාමරංගකැන්න, මාගල්ගස, නාගේගස, වැලිතුඩුවේ මූකලාන (මූකලාන්, හේන්, දියපාර වල්, අඩිපාරවල් යනාදිය) | 11,872 3 8 |

මීට මායිම්—උතුරට: හල්වතුරකැලේ සහ තෙලිහිගල යන ගම්වල ගම්ඉමද, මධ්‍යම දිසාවේ නොම්මර 6යේ ටෝපෝ මූල් සිතියමේ මායිමද.

නැගෙණහිරට: මධ්‍යම දිසාවේ නොම්මර 6යේ සහ 7යේ ටෝපෝ මූල් සිතියම්වල මායිම්ද.

දකුණට: නොම්මර 2කේ ටෝපෝ මූල් සිතියමේ මායිමද, අඹවිකන්ද, පැලැන්දකන්ද, අඹවිකන්ද, ගසබොඩ, මූරුත්තෙවිටුකන්ද, ගසබොඩ සහ මූරුත්තෙවිටුකන්ද යන ගම්වල ගම්ඉම්ද.

බස්නාහිරට: මාගල යනගම ගම්ඉමද.

II. වෙනි කොටස.

නොම්මර 1කේ ටෝපෝ මූල් සිතියමට අයිති නොම්මර 1 දරන කුඩා සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2 | කාඹරන්ගකැන්න .. | .. 0 2 0 |

මීට මායිම්—උතුරට, නැගෙණහිරට, දකුණට සහ බස්නාහිරට: නොම්මර 1කේ ටෝපෝ මූල් සිතියමේ නොම්මර 1 දරන බිම්කට්ටිය.

කෑගල්ල නි. නී. 10—1936.




ජාතික පුස් ... ල හා

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවලට අනුව ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 17වෙනි දිනවූ සඳුදා පෙරවරු 10යට බදුළු කච්චේරියේදී අවුරුදු 99යකට වෙන්දේසියේදී බදු දෙනු ලැබේ.

මෙම විකිණීමේදී වැඩි ඉල්ලුම්කාරයා බදුකාරයා වේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණා ඌව පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ ගෙන්ද, එහි සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේ ගෙන්ද ලබාගත හැක.

සිතියමේ නො. ඇල්ලේ ටවුන් ප්ලෑන 11. ගම—යටිකිඳ කුඹල්වෙලකෝරළේ ඇල්ලේටවුම.

| බිම් කැබැල්ල. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | විස්තර. | ප්‍රමාණය, අ. රූ. ප. | වෙන්දේසිය පටන් ගන්න අක්කරයක ප්‍රමියම් ගනන. රු. ශ. | පළමු තිස් අවුරුද්ට අවුරුද්දක බද්ද. රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 1H | බොරඹියගෙල පතන | හිඳගොඩ ඩී. ඇ්ජ්. ද සිල්වා | අවුරුදු 7 පණම වයසැති ආණ්ඩුව මගින් වවනලද ගස් තිබේ | 0 1 38·7 .. | 60 60 .. | 60 60 |
| 1J | එම .. | එම .. | එම සහ පතන .. | 0 2 6·45 .. | 60 60 .. | 60 60 |

මෙම ඉඩම් බදු ගැණුම්කාරයා විසින් මිලකුනුම් දිනේ සිට අවුරුදු දෙකක් ඇතුලත ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් ස්ථිරකරණ ලැබූ ප්ලෑනක ප්‍රකාරයට වටිනා කමින් රුපියල් 1,000කට අඩුනොවන ස්ථිර ගොඩනැගිල්ලක් සෑදිය යුතුයි.

වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,958, S. O.**—ඉඩම් නිරවුල්කරණ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ අගෝස්තු 21වෙනි දිනවූ සිකුරාදා පස්වරු 3ට කන්දේගෙදර ඉඩමේගම කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ වියලුව කොට්ඨාසයේ වියලුවකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබෙලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 355. ගම—වටගොඩගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම, | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 14F | ආරාවේවත්ත .. | ආණ්ඩුව, රජපක්ෂදේවසාලාගේ ලප්සමාගේ දන්තුවා විසින් වැඩිපුර අල්ලාගෙන තිබෙන බිම | වත්ත | .. 0 0 25 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,959, S. O.**—ඉඩම් නිරවුල්කරන නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 19වෙනි දිනවූ බදාදා පස්වරු 3ට කන්දේගෙදර ඉඩමේගම කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ යටිකිඳ කොට්ඨාසයේ බෝගොඩකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 367, ගම—කොකාවියාමලුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 26 | කොකාවියාමලුවේහේන | ආණ්ඩුව, බෝගොඩ රජමහවිහාරාධිපති බෝගොඩ අමුනු මූල්ල සුමන්ගල තෙරුන්නාන්සේ | හේන | .. 23 0 30 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,960, S. O.**—ඉඩම් නිරවුල්කරන නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 18වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කන්දේගෙදර ඉඩමේගම කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ වියලුව කොට්ඨාසයේ සොරනෑතොටකෝරළේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියම් නො. 380. ගම—ගල්බොක්කේගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 10 | අගලේවෙලවත්තේහේන | (1) අගලේවෙලගෙදර පුංචිරාල, (2) ආරාවේගෙදර තිස්සහාමි, (3) කිරිබරුවේ පදිංචි අප්පුහාමි ආරච්චි සහ තවත් අයවල් | හේන | .. 0 2 32 |
| 11 | හකුරුආරාවේහේන .. | (1) රටදෙඹන්කස්වත්තේගෙදර කිරි, (2) කිරිපනික්කියා, (3) කිරිබරුවේ පදිංචි අප්පුහාමි ආරච්චි සහ තවත් අයවල් | එම | .. 0 3 38 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

**No. 11,961, S. O.**—ඉඩම් නිරවුල්කරන නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 26වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට කන්දේගෙදර ඉඩමේගම් කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කේ වියලුව කොඨාසයේ සොරනෑතොටකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබිලි 1ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 369. ගම—කපල්ලෙවෙල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකින්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 87 | පාලුවත්ත .. | ඇම්. ඇම් අල්ලාපිච්චේ .. .. | හේන් .. | 0 3 1 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒකේ සිතියම කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 30වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,962, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9ට පොල්පිටිගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ හිරියාල හත්පත්තුවේ දිවිගන්දහේකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,875. ගම—අළුත්වෙගෙදර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතියමකියන්නා. | අනුම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3 | වැවඉහලගාල .. | (1) ආර්. ඇම්. රන්හාමි, (2) ඩී. ඇම්. උක්කුහාමි, (3) කේ. ඇම්. කපුරුහාමි, (4) එම කිරල හිටපු විදානේ, (5) ඩබ්ලිව්. රන්හාමි, (6) බන්ඩිරාලගේ උක්කුමැණිකා, (7) ඩී. ඇම්. බන්ඩා, (8) පින්හාමිල්ලේගෙදර ඩිංගිරිබන්ඩා හිටපුවිදානේ, (9) එම පිකිරාල | දුම්ගාල .. | 1 0 16 |
| 17 | වැවපාවුලගල .. | (1) බන්ඩිරාලගේ උක්කුමැණිකා, (2) ඩී. ඇම්. උක්කුහාමි, (3) කේ. ඇම්. කපුරුහාමි, (4) එම කිරල හිටපු විදානේ, (5) එම රන්හාමි, (6) බන්ඩිරාලගේ උක්කුමැණිකා, (7) ඩී. ඇම්. බන්ඩා, (8) පින්හාමිල්ලේගෙදර ඩිංගිරිබන්ඩා හිටපුවිදානේ, (9) එම පිකිරාල | දුම්ගාල (පාලු) (වැව කන්ඩියට ඉතිරි කර තිබෙන බිම) | 0 1 13 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූලි මස 1වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,963, S. O.**—ඉඩම් නිරවුල්කරණ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9ට පොල්පිටිගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ කුරුණෑගල දිස්ත්‍රික්කේ හිරියාල හත්පත්තුවේ දිවිගන්දහේකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,870. ගම—රඹෑව.

| නො. | ඉඩමේනම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 21 | අඹුණිඉහලගල .. | (1) රඹෑවේ සයියා, (2) ජයවර්ධනමුදියන්සේලාගේ පිකිරිබන්ඩා, (3) නම්මැව්වටකාරයාලාගේ කුමා, (4) එම පන්චා, (5) එම කිරා සහ තවත් අයවල් | දුම්ගාල .. | 1 3 5 |
| 34 | කොස්ගහමුලගල .. | (1) රඹෑවේ බසියා, (2) එම කපුවා .. .. | එම .. | 1 1 24 |
| 38 | වෙලගාවවත්ත .. | හිරල්ලුගම පදිංචි (1) ජයවර්ධනමුදියන්සේලාගේ පිකිරිබන්ඩා, (2) එම කුමා | වත්ත .. | 0 0 29 |

තක්සේරු මිල අක්කරයක් රු. 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූලි මස 1වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 11,964, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ සැප්තැම්බර් මස 24වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට පොල්පිටිගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේහිරියාල හත්පත්තුවේ දිවිගන්දහේකෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 11ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,876. ගම—කදුරුවැව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 13 | දන්ගහමුලගාල .. | කොලමුනේ මුදියන්සේලාගේ පුංචිරාල .. .. | දුම්ගාල .. | 0 2 3 |
| 14 | පාරගාවවත්ත .. | එම උක්කුමැණිකා .. .. .. | වත්ත .. | 0 0 24 |
| 16 | මීගහමුලවත්ත .. | දීගල්ලේ මුදියන්සේලාගේ අප්පුහාමි හිටපු විදානේ .. | එම .. | 0 2 26 |
| 19 | මුලුගහමුලගාල .. | කොලමුනේ මුදියන්සේලාගේ කිරාල හිටපුවිදානේ, (2) උක්කුබන්ඩා | එම .. | 0 3 32 |
| 20 | මුලුගහමුලවත්ත .. | එම .. .. .. | එම .. | 0 0 27 |
| 22 | දන්ගහමුලගාල .. | දීගල්ලේ මුදියන්සේලාගේ අප්පුහාමි හිටපුවෙල්විදානේ .. | දුම්ගාල .. | 0 1 11 |
| 23 | කොස්ගහමුලගාල .. | කොලමුනේ මුදියන්සේලාගේ බන්ඩා, (2) පිකිරිමැණිකා .. | පාලුදුම්ගාල .. | 0 0 33 |
| 25 | වෙලගාවවත්ත .. | (1) දීගල්ලේ මුදියන්සේලාගේ බන්ඩා, (2) එම රන්හාමි, (3) එමඅවුසදහාමි | වත්ත .. | 1 1 39 |
| 26 | කහටගහමුලවත්ත නොහොත් මුලුගහමුලවත්ත | කොලමුනේ මුදියන්සේලාගේ රන්හාමි .. | එම .. | 0 3 17 |
| 27 | දඹගහමුලවත්ත .. | (1) කොලමුනේ මුදියන්සේලාගේ රන්හාමි, (2) එම හීන්බන්ඩා, (3) එම උක්කුමැණිකා, (4) එම කලුමැණිකා | එම .. | 3 1 23 |
| 34 | ඇලගාවගාල .. | දීගල්ලේමුදියන්සේලාගේ කළුබන්ඩා ගන්ආරච්චි .. | පාලුදුම්ගාල .. | 2 0 0 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1936ක්වූ ජූලි මස 1වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නො. 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගම්පල කඩුගන්නාව පාරේ මහජනයාගේ ප්‍රයෝජනය සඳහා වැසිකිලියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. (ඒ), A345. ගම—මඩෑම පලාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පල පලාත් ආණ්ඩු සභාවට ඇතුළත්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කඩුගන්නාව පාරේ වරිපනම් නො. 26M දරන "බෑන්ක් හවුස්" නම් ඉඩමෙන් කොටසක් | මේ ඉඩමෙහි අවුරුදු 15ක් පමණ වයසැති පොල්ගස් 2ක්ද, වයස අවුරුදු 10ක් පමණ ඇති පුවක්ගස් තුනක්ද තිබේ. ඒවා සිමෙන්තිවලින් සෑදූ කානුවකින් කොටසක්ද අයිතිය | ඇම්. පී. ඈම්. නාරායනන් චෙට්ටියාර්, අඹගමුව පාර, ගම්පල | 0 0 5·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 3වෙනි දින උදේ 9 කනිසමට ගම්පල පලාත් ආණ්ඩු සභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ ජූනි මස 25වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ආර්. මොතිපෙති,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—බස් නැවත්වීමේ ස්ථානයක් සහ ශාලක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබා ගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබිතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,081. ගම—කීරිමලෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාදකල්කුරවිල්පුදුකාඩු .. | අවුරුදු 15ක් පමණ වයසැති කොසඹගස් 5ක් තිබෙන මුඩුබිම | වයඹ තෙල්ලිප්පලේ පදිංචි ඇස්. සංගරපුල්ලේගේ ස්ත්‍රී සෙල්ව නායකි පුල්ලේ | 0 3 2·15 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූලි මස 27වෙනි දින පෙරවරු 10යේ කනිසමට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි. ඉඩමට අතිකම් කියා සිටින ලිය කියමන්ද ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1936ක්වූ ජූනි මස 22වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඒ. වී. ඩෙඩිසන්,
උ. ප. ආණ්ඩුවේ ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වවුනාතිවුවේ ලිඳක් හෑරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 227. ගම—වවුනාතිවු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තුනඩිවයල් .. | වතුරවළවල් (කුඹුරක කොටසක්) .. | රාමලින්ගම් පරමානන්දම් .. | 0 0 1·62 |
| 2 | එම .. | කුඹුර .. .. | එම .. .. | 0 0 3·70 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ ජූලි මස 27වෙනි දින පෙරවරු 10යේ කනිසමට මඩකලපුව කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ ජූනි මස 29වෙනි දින
මඩකලපුව කච්චේරියේදීය.

සී. සින්නම්පලම්,
මඩකලපුවේ ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වදකඩ ගැහැනු ස්කෝලයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

මුල් සිතියමේ නො. A 443. ගම—වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කුවේ දඹදෙණිහත්පත්තුවේ උඩපොල ඔතොට බස්නාහිරකෝරලේ ඒදඹුපිටිය යන ගමේ.

| නො. | ඉඩමේනම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොලොන්ගොල්ලේහේන .. | හේන (එක පොල්ගහක් තිබේ) | වදකඩ පදිංචි පී. ඒ. ඊසා උම්මා .. | 0 3 20·7 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1936ක්වූ අගෝස්තු මස 8වෙනි දින පෙරවරු 9.30යේ කනිසමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1936ක්වූ ජූනි මස 26වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

එච්. සී. කොක්ස්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

## ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

### අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමකි. D/2495

(මධ්‍යම පන්තියේ ලාංකිකයන් සම්බන්ධයෙනි.)

මෙහි පහත විස්තර දැක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගනු පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගැනීම පිණිසත් ඇල්පිටියේ ගම්සභා උසාවියේදී වර්ෂ 1936ක්වූ අගෝස්තු මස තුන්වෙනි දින පූර්වභාග නමයට 1935ගේ අංක 19 දරණ ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් දකුණු පළාතේ ආණ්ඩුවේ මහඒජන්ත තුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ. දෙනු ලබන ඉඩම් කැබලි අක්කර හයක් පමණවේ.

2. මෙම ඉඩම්කට්ටි ඇල්පිටිය සහ ඊට යාවූ ඉගල, ඇල්ලතණබද්දේගම සහ කුරුදුගහ හැතැප්ම යන ගම්වල පදිංචිකාර මධ්‍යම පන්තියේ ලාංකිකයන්ට පමණකි.

3. තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන් මහ ඒජන්ත තුමා විසින් ස්ථිරකරණු ලබන ප්ලෑනයක ආකාරයට සුදුසු ගෙවඩ නැගිල්ලක් සාදා එහි පදිංචිවන්ට ඕනෑය.

4. සියළුම ඉල්ලුම්පත්‍ර රුපියල් තුනක මුදලක් සමග මහ ඒජන්තතුමා වෙත ගාල්ලේ කච්චේරියට වර්ෂ 1936ක්වූ ජූලි මස 31වෙනි දින හෝ ඊට මත්තෙන් ලැබිය යුතුයි. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා උවමනා නැති අමතර මැනීමක් කිරීමට ආණ්ඩුවට සිදුවුවහොත් මේ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මුදලක් ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසුදීම හෝ නොදීම යුක්තිසහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරණ තීරණය අවසාන තීරණය වන්නේය.

5. සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයෙකු එවිය යුතුයි.

6. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය දකුණු පළාතේ මහ ඒජන්ත තුමාගෙන් විභාග කළයුතුයි. ඉඩම්වල සටහන් සුළු මුදලක් ගෙවා සර්වේයර් ජනරාල් තුමාගෙන් ලබාගත හැක.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමා.

වර්ෂ 1936ක්වූ ජූලි මස 3වෙනි දින කොළඹදීය.

### දීමට යන ඉඩම්වල විස්තර.

ඇල්ලතණබද්දේගම යන ගම පිහිටි නොම්බර 582 දරණ අවසාන ගම් සිතියමේ ලොට් 11B1, 11B2, 11B3, 11B4, 11F, 11G, 11H, 11I, 11J, 11K, 11L, 11M, 11N, 11O, 11P, 11Q, 11R, 11S, 11T, 11U, 11V, 11W, 11X, 11Y, 11Z, 11AA, 11AB, 11AC, 11AD, 11AE, 11AG, 26B, 26C, 23D, 26I, 37C, 37E, 44½, 47, 47B, 47C, 47D, 47E, 47F, 47G, 47H, 47I, 47K යනාකාර දැක්වෙන එකතුව අක්කර 28 රූඩ් 3 පර්චස් 8ක් පමණ ඇති ඉඩම් කැබලි.

---

## දැන්වීමයි.

බස්නාහිර පළාතේ කොළඹ සහ මීගොමු දිස්ත්‍රික්කු සීමා තුළ පිස්සුබලු රෝගයෙන් අන්තරාය දැනට ඇති බව වර්ෂ 1930ගේ නොම්මර17ගේ සහ වර්ෂ 1929ගේ නොම්මර 6ගේ ආඥාපණත්වලින් අර්ථවැකියා කරණලද වර්ෂ 1893ගේ පිස්සුබලු ආඥාපණතේ 10A වගන්තියේ ප්‍රකාර මට ලැබී තිබෙන බලය පරිදි මෙයින් ප්‍රකාශකරමි. බැඳ නොසිටිනා හෝ කෙනෙකුන් විසින් ලනුවක හෝ දම්වැලක ආධාරයෙන් ගෙනයනු නොලබන යම්කිසි බල්ලෙක් ප්‍රසිද්ධ ස්ථානයකදී නොහොත් පාරකදී හම්බවුවහොත් ඌ විනාශකරදමනු ලැබේ.

වර්ෂ 1936ක්වූ ජූනි මස 26වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.